# 06 පරිමේය සංඛ්‍යා

නිඛිල දෙකක අනුපාතයක් ලෙස, එනම් භාගයක් ලෙස (හරය ''0'' නොවන) දැක්විය හැකි සියලු ම සංඛ්‍යා පරිමේය සංඛ්‍යා වේ.

උදා :- $\frac{1}{8}, \frac{3}{4}, \frac{1}{3}, \frac{8}{9}, 2, 3, \sqrt{25}, \sqrt{16}, \sqrt{49}$

$2 = \frac{2}{1}$
$3 = \frac{3}{1}$
$\sqrt{25} = 5 = \frac{5}{1}$
$\sqrt{16} = 4 = \frac{4}{1}$

පරිමේය සංඛ්‍යා කුලකය $\mathbb{Q}$වලින් අංකනය කෙරෙන අතර $\mathbb{Q}$ කුලකය වීජීය අංකන ක්‍රමය යටතේ මෙසේ ලියා දැක්විය හැකි ය.

$$\mathbb{Q} = \{x : x = p/q : p, q \in Z, q \neq 0\}$$

මේ අනුව පරිමේය සංඛ්‍යා කුලකය මෙසේ දැක්විය හැකි ය.

- පරිමේය සංඛ්‍යා
  - නිඛිල
  - භාග
    - අන්ත දශම
    - සමාවර්ත දශම

මේ අනුව $\mathbb{Z}$ නිඛිල සංඛ්‍යා කුලකය පරිමේය සංඛ්‍යා කුලකයේ උපකුලකයක් වේ.

එනම් $\mathbb{Z} \subset \mathbb{Q}$ වේ.

## අන්ත දශම

යම් භාගයක් දශම සංඛ්‍යාවක් ලෙස ප්‍රකාශ කිරීමේ දී ලවය හරයෙන් ඉතිරි නැති ව බෙදිය හැකි නම් එවැනි දශම අන්ත දශම වශයෙන් නම් කෙරේ.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

#### නිදසුන (1)

| | |
|---|---|
| $\frac{1}{2} = 0.5$<br>$\frac{3}{4} = 0.75$<br>$\frac{1}{8} = 0.125$ | 0.763450<br>4.56780<br>7.5630 |

මේවා ද අන්ත දශම වේ.

#### 6-1 අභ්‍යාසය

පහත දැක්වෙන එක් එක් භාග සංඛ්‍යා දශම සංඛ්‍යා ලෙස ප්‍රකාශ කර එය අන්ත දශමයක් ද නොවේ ද යන්න සඳහන් කරන්න.

I. $\frac{1}{3}$ II. $\frac{2}{3}$ III. $\frac{6}{7}$ IV. $\frac{3}{4}$ V. $\frac{10}{3}$

VI. $\frac{5}{6}$ VII. $\frac{8}{3}$ VIII. $\frac{9}{7}$ IX. $\frac{16}{17}$ X. $\frac{8}{5}$

## සමාවර්ත දශම

භාගයක් දශම සංඛ්‍යාවක් ලෙස ප්‍රකාශ කිරීමේ දී ලැබෙන දශම කොටසෙහි සංඛ්‍යා එකක් හෝ කිහිපයක අගය පුන පුනා ලැබේ නම් එවැනි ඒවා සමාවර්ත දශම ලෙස ලිවිය හැකි ය.

#### නිදසුන (2)

$\frac{10}{3} = 3.333$ ............

$\frac{1}{3} = 0.333$ ............

$\frac{22}{7} = 3.1428571$ ............

සමාවර්ත දශම මෙසේ කැටිකර ලිවිය හැකි ය.

ඒ අනුව

3.333 ........ = $3.\dot{3}$

3.1428571 ........ = $3.\dot{1}4285\dot{7}$

0.333 .......... = $0.\dot{3}$

#### 6-2 අභ්‍යාසය

1. පහත සඳහන් භාග සංඛ්‍යා දශම සංඛ්‍යා ලෙස ප්‍රකාශ කර ඒවා සමාවර්ත නම් කැටි කර ලියන්න.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

| භාගය | දශමයක් ලෙස | කැටිකර ලිවීම |
|---|---|---|
| $\frac{5}{6}$ | | |
| $\frac{5}{3}$ | | |
| $\frac{4}{3}$ | | |
| $\frac{17}{3}$ | | |
| $\frac{19}{15}$ | | |

2. පහත සඳහන් භාග අතරින් සමාවර්ත දශම තෝරා ලියන්න.

   I. $\frac{4}{3}$ II. $\frac{100}{15}$ III. $\frac{18}{5}$ IV. $\frac{47}{15}$ V. $\frac{85}{12}$ VI. $\frac{95}{3}$ VII. $\frac{425}{35}$ VIII. $\frac{89}{7}$

3. පහත සඳහන් පරිමේය සංඛ්‍යාවල දළ පිහිටීම සංඛ්‍යා රේඛාවක් මත නිරූපණය කරන්න.

   I. 2 II. –4 III. 1.7 IV. $\frac{1}{3}$

4. පහත සඳහන් සංඛ්‍යා සමූහයෙන් පරිමේය සංඛ්‍යා කුලකය තෝරා සඟල වරහන් තුළ ලියා දක්වන්න.

   $\sqrt{4}$ 3.145..... -4 5 $\frac{22}{7}$ $\frac{1}{2}$ $\sqrt{25}$ -2 7 $\frac{3}{4}$ 4.3 $\sqrt{5}$ $\sqrt{2}$

5. පහත සඳහන් සංඛ්‍යා ආරෝහණ පිළිවෙළට සකස් කරන්න.

   2.51 $\frac{5}{2}$ $\frac{10}{3}$ $\frac{22}{7}$ 3

6. පහත සඳහන් දශම භාග සංඛ්‍යා ලෙස ලියා දක්වන්න.

   I. 0.6 II. 0.25 III. 0.45 IV. 0.55 V. 0.125

## සාරාංශය

- පරිමේය සංඛ්‍යා ප්‍රධාන වශයෙන් නිඛිල හා භාග වශයෙන් කොටස් දෙකකි.
- භාග, අන්ත දශම හා සමාවර්ත දශම වශයෙන් කොටස් දෙකකි